Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය :: චිත්‍ර කලාව

සතිය : පස්වන සතිය

ශ්‍රේණිය : 6

සකස් කිරීම : D.P.එපිටවත්ත මිය


මාවනැල්ල අධ්‍යාපන කලාපය

- නිපුණතාව 3.0 : පාරිභාරික අවශ්‍යතා සඳහා මෝස්තර නිර්මාණකරණයේ යෙදෙයි.
- නිපුණතා මට්ටම 3.1 : මූලික වර්ණ භාවිතයෙන් සැරසිලි නිර්මාණය කරයි.
- ක්‍රියාකාරකම 3.1.1 : "නිල්, කහ, රතු යොදමු අලුත් රටා මවමු."
- කාලච්ඡේද සංඛ්‍යාව : 02 යි.
  - සපයාගතයුතු ද්‍රව්‍යයන් :බ්‍රිස්ටල් බෝර්ඩ්, කතුරු, ගම්, රළු මතුපිටක් සහිත (ලේස්, ගෝනි) වැනි ද්‍රව්‍යයක් සුදු ඩොවින් කඩදාසියක් නිල්, කහ, රතු වර්ණ- ,චිත්‍ර අඳින කඩදාසි ,

## 'නිල්, කහ, රතු යොදමු අලුත් රටා මවමු.'

➢ **මූලික වර්ණ හඳුනා ගනිමු.**

රතු කහ, නිල්,



➢ **අච්චුවක් මගින් හැඩතල පිටපත් කරමු**



➢ **නිර්මාණය කරගත් අච්චුවක් මගින් හැඩතල පිටපත් කරන්න**

- අච්චුව මගින් ඇඳගත් හැඩතලවලට මූලික වර්ණ යොදන්න
- රටාවක් මතුවන සේ හැඩතල භාවිත කරන්න
- පසුබිම අලංකරණය සඳහා විවිධ ක්‍රම ශිල්ප උපයෝගි කරගන්න





**ගවේෂණ/ *කාර්ය උපදෙස් පත්‍රිකාව***

- සරල මතුපිටක් සහිත පත්‍ර කීපයක් ආදර්ශ ආකෘති ලෙස ගන්න.
- තෝරාගත් ආදර්ශය ඇසුරෙන් අච්චුව සඳහා හැඩයක් බ්‍රිස්ටල් බෝර්ඩ්වල ඇඳ කපා ගන්න.
- කපාගත් එම හැඩය ඩ්‍රොවින් කඩදාසියේ තබා සැරසිල්ලට අවශ්‍ය පමණ පිටපත් ඇඳගන්න.
- නිල්, කහ, රතු යොදා පිටපත් කළ හැඩතල වර්ණ කර ගන්න.
- එම චිත්‍ර හැඩ කපා වෙන්කර ගන්න.
- සැරසිල්ල කරන කඩදාසිය ගෝනි, ලේස් වැනි රළු මතුපිටක තබන්න.
- කළු වර්ණ පැස්ටල් කූර පෙරළා සමස්ත තලයම මෘදුව (සැහැල්ලු අනිත්) වර්ණ කරන්න.
- රළු ද්‍රව්‍යයෙහි මතුපිට ස්වභාවය නිතැතින් මතුවන අයුරු අවධානයට ගන්න.
- කපාගත් හැඩ සමබර වන සේ වර්ණ කළ කඩදාසියේ අලවා ගන්න.
- ඇලවීමේ දී මිණුම් ක්‍රම ඇසුරෙන් විධිමත් රටාවක් ගොඩනගා ගන්න.